පරිගණක විද්‍යාගාරය ආරක්ෂිතව භාවිතය

ඔබගේ පාසලේ පරිගණක විද්‍යාගාරය සතුව පවතින සම්පත් නිවැරදිව හා ආරක්ෂිතව පරිහරණය කිරීම ඔබ සතු වගකීමකි. එහිදී ඔබගේ ආරක්ෂාව හා උපාංග වල ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ. පරිගණක විද්‍යාගාරය තුල අන් අයට බාධාවක් නොවන ආකාරයෙන් හැසිරීම හා අන් අයගේ පරිගණක ක්‍රියාකාරකම් වලට අනවසරයෙන් මැදිහත් නොවීම යනාදිය ඔබ විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්මයන් වේ.

එසේම ඔබ පරිගණක භාවිතා කිරීමේදී ඒ සඳහා සුදුසු ඉරියව් අනුගමනය කළ යුතු වේ. එසේ නොවීමෙන් ඇසේ වේදනාව හා කොන්දේ වේදනාව වැනි විවිධ සෞඛ්‍යමය ගැටලු වලට මුහුණ පෑමට ඔබට සිදු වේ.

- **පහත සඳහන් ක්‍රියාකාරකම් පරිගණක විද්‍යාගාරය තුළ සිදු කිරීම සුදුසු නම් (✓) ලකුණ ද නුසුදුසු නම් (×) ලකුණද වරහන් තුල යොදන්න.**

(01) පරිගණක විද්‍යාගාරය තුළ දුව පැන සෙල්ලම් කිරීම ( )

(02) වෛරස පරීක්ෂාවක් සිදු නොකර බාහිර ආචයන උපාංග පරිගණකයට සම්බන්ධ කිරීම ( )

(03) දිනපතා පරිගණක විද්‍යාගාරයේ සියලු උපකරණ වල දූවිලි පිස දැමීම ( )

(04) ගුරු තුමියට නොදන්වා අන්තර්ජාලයට සම්බන්ධ වී වීඩියෝ දසුන් බැලීම ( )

(05) ආහාර පාන ජලය හා වෙනත් දියර වර්ග විද්‍යාගාරය තුලට රැගෙන යාමෙන් වැලකීම ( )